| | | |
|---|---|---|
| | කැලණිය අධ්‍යාපන කලාපය | |
| | දෙවන වාර පරීක්ෂණය - 2017 | |
| 10 ශ්‍රේණිය | පෙරදිග සංගීතය I | කාලය පැය 03 |

නම : ..........................................................................................

- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. රාගාධාරි ශාස්ත්‍රීය සංගීතය හැදෑරීමේදී රාග සංගති පුහුණු වීම සඳහා වඩාත් සුදුසු ගීත විශේෂය,
    (i) ස්වර ස්ථාපන ගීත (ii) සර්ගම් ගීත (iii) මධ්‍යලය ගී (iv) ලක්‍ෂණ ගීත

02. භෛරවි සර්ගම් ගීතයේ ඇතුළත් ස්වර සංගතියකි,
    (i) ගපධනිසා (ii) නිරිගරිස (iii) ධමධනිසා (iv) රිගරිමගරිස

03. බුද්ධාලම්භන ප්‍රීතිය දැනවීමට සමත් රාග රසයක් ලබාගත හැකි හින්දුස්ථානි රාගයකි,
    (i) භෛරවි (ii) කාෆි (iii) බිලාවල් (iv) භූපාලි

04. නිරිගමගරිස යන ස්වර සංගතිය යමන් රාගයේ ස්වර සංගතියක් වීමට නම්,
    (i) ග, නි ස්වර කෝමල විය යුතුය. (ii) රි, ධ ස්වර කෝමල විය යුතුය.
    (iii) 'ම' ස්වරය තීව්‍ර විය යුතුය. (iv) 'නි' ස්වරය කෝමල විය යුතුය.

05. භෛරවි සහ යමන් රාග දෙක සම්බන්ධව නිවැරදි ලක්‍ෂණය කියැවෙන්නේ,
    (i) භෛරවි සම්පූර්ණ ජාති රාගයක්, යමන් ඖඩව ජාතියට අයත් ය.
    (ii) රාග දෙකම කල්‍යාණ මේලයෙන් ජනිත වේ.
    (iii) රාග දෙකෙහිම විකෘති ස්වර හතර බැගින් යෙදේ.
    (iv) රාග දෙකෙහිම භක්ති, කරුණා රස ජනිත වේ.

06. "සපිරුණු මේ රාග භෛරවි" යන ලක්‍ෂණ ගී පාදයෙන් භෛරවි රාගයේ ලක්‍ෂණයක් කියවේ. එම ලක්ෂණය නම්,
    (i) වාදී ස්වරය 'ස' වේ. (ii) සම්පූර්ණ ජාතිය වේ.
    (iii) සියලු ස්වර කෝමල වේ. (iv) ථාඨය භෛරවි වේ.

07. ශුද්ධ රි, ග, ධ, නි සහ තීව්‍ර ම යන ස්වර,
    (i) යමන් රාගයේ අනුවාදී ස්වර වේ. (ii) භෛරවි රාගයේ විකෘති ස්වර වේ.
    (iii) යමන් රාගයේ විකෘති ස්වර වේ. (iv) භෛරවි රාගයේ විවාදී ස්වර වේ.

08. භෛරවි රාගයේ මුඛ්‍යාංගය වන්නේ,
    (i) සරිස, මගරිස (ii) ගම, ධම, ගරිස (iii) ගරිසපධනිසා (iv) සරිස, ධනිසරිස

09. මධ්‍යලය, ලක්ෂණ ගීත හෝ සර්ගම් ගීත ගායනයේදී සහාය කරගත හැකි අත්‍යවශ්‍ය භාණ්ඩ යුගලයකි,
(i) තබ්ලාව - සිතාරය (ii) තබ්ලාව - බටනලාව
(iii) තබ්ලාව - වයලීනය (iv) තබ්ලාව - තාම්පුරාව

10. භෛරවී රාගයේ ස්වර රසවිඳීම සඳහා ශ්‍රවණය කළ හැකි රාගාශ්‍රිත සරල ගීයක් නොවන්නේ,
(i) එන්න මදනලේ (ii) පාරමිතා බලපූරිත
(iii) කවාලා විලඳ ජාති (iv) ස්වර්ණ ප්‍රදීපය මාන

- **පැහැසරණිය මිණි පැමිණිය කොත් අගට ....**
**බඳ කිකිණිය දද ගිගිනිය විමන් වට ....**

11. ඉහත ගීතය සම්බන්ධ නිවැරදි තොරතුරු ඇතුළත් ප්‍රකාශය වන්නේ,
(i) සමුද්‍ර ඝෝෂ විරිතට ගැයෙන ගුත්තිලයේ පැදියකි.
(ii) සැලලිහිණි සංදේශයේ එන දොලොස්මත් සේ ගීයකි.
(iii) සමුද්‍රඝෝෂ විරිතට ගැයෙන සේ ගීයකි.
(iv) වෑත්තෑවේ හිමි විසින් රචිත ගුත්තිලයේ පැදියකි.

12. ඉහත පැදියෙන් වර්ණනා කෙරෙන වැදගත් ස්ථානයකි,
(i) කැලණිය පුද බිම (ii) කැලණි ගං තෙර
(iii) දළදා මැදුර (iv) පල සපිරි වන පියසි.

13. 'සමුද්‍ර ඝෝෂ විරිත' සම්බන්ධ වැරදි ප්‍රකාශය වන්නේ,
(i) අනාඝාතාත්මකව ගැයේ
(ii) දස අටමත් විරිතකින් යුක්තය
(iii) මුහුදේ රළ නගින බසින ආකාරයට තනු නිර්මාණය වී ඇත.
(iv) තාලානුකූලව ගායනා කරයි.

14. සමුද්‍ර ඝෝෂ විරිතට ගැයිය හැකි වෙනත් ගී පාදයක් වන්නේ,
(i) සුර රද සමන් සමඟින් සුරගන එවර (ii) මනමත් කරවන දන මුළු දෙරණා
(iii) සෙත් සිරි දෙනමහ ගුණ මුහුදානන් (iv) සඳවා සුදුවැලි පිච්තුරු

15. ගුත්තිල කාව්‍යය විවිධ විරිත් අනුව රචනා වී ඇති කාව්‍ය ග්‍රන්ථයකි. එහි ඇතුළත් විරිත් කීපයකි,
(i) දොලොස්මත්, සොලොස්මත්, අටවිසිමත් (ii) දොලොස්මත, තුදුස්මත්, සයමත්
(iii) දසමත්, දොලොස්මත්, අටවිසිමත් (iv) දොලොස්මත්, සොලොස්මත්, දෙතිස්මත්

16. ගුත්තිලයේ පැදි අතරින් මැදුම් තනි තිතට ගැයෙන පැදිය වන්නේ,
(i) සඳවා සුදුවැලි පිච්තුරු (ii) මන්මත් කරවන දන මුළු දෙරනා
(iii) රූ රැයේ අඳිනා ලෙසේ අත් (iv) උදේනි පුරසිට

17. සේ ගී ලක්ෂණයක් නොවන්නේ,
(i) අතිශයෝක්තියෙන් වර්ණනා කිරීම. (ii) වියත් බසින් රචනා කිරීම.
(iii) අනුප්‍රාසය, එළිවැට, ශබ්දාලංකාර සහිත බව (iv) නිර්ව්‍යාජ අදහස් ගැබ්වීම.

18. තුන් සරණේ ගීත සම්බන්ධ නිවැරදි හැඳින්වීම වන්නේ,
(i) භක්ති රසය දනවන ආසාතාත්මක ගැමි ගී විශේෂයකි.
(ii) භක්ති රසය දනවන අනාසාතාත්මක ගැමි ගී විශේෂයකි.
(iii) සිරිපා වන්දනාව පිළිබඳ කියවෙන සේ ගී විශේෂයකි.
(iv) ත්‍රිවිධ රත්නය පිළිබඳව කියවෙන සමාජ ගී විශේෂයකි.

19. 'දොඩම් කපාල ඇඹුල් තනාලා' යන ගැමි ගීයෙන් අරුත් ගැන්වෙන්නේ,
(i) ඔළිඳ කෙළියේ යෙදෙන කාන්තාවකගේ වර්ණනාවක්. (ii) ඔළිඳ ක්‍රීඩාව පිළිබඳ වර්ණනාවක්
(iii) ගැමි පරිසය වර්ණනා කිරීමක් (iv) ඔළිඳ පෝරුව පිළිබඳ විස්තරයක්

X 2 0 3
20. | ධි නා | ධි ධි නා | ති නා | ධි ධි නා | මෙම තබ්ලා පදය වාදනයේදී දායාව - බාධාව කොටස් දෙකින්ම එකවර වාදනය කෙරෙන අක්ෂරය වන්නේ,
(i) ධි (ii) නා (iii) ති (iv) ධිනා

21. ඉහත තාලයේ දායාවෙන් පමණක් වාදනය වන අක්ෂර හිමි විභාගයට අදාළ තාල සංකේතය වන්නේ,
(i) X (ii) 2 (iii) 0 (iv) 3

22. 'නා' අක්ෂරය වාදනය කළ හැක්කේ,
(i) දායාවේ ලවයෙනි. (ii) දායාවේ චාන්ටියෙනි.
(iii) බායාවේ චාන්ටියෙනි. (iv) දායාවේ සයාහි කොටසිනි.

23. 'ධි' අක්ෂරය වාදනයෙදී බායාවෙන් වැයෙන අක්ෂරය වන්නේ,
(i) ක (ii) කි (iii) කත් (iv) ගෙ

24. තබ්ලාව හා තබ්ලාවාදන පිළිබඳව තොරතුරු ඇතුළත් ''සම්භාව්‍ය තාල දීපනි'' නම් කෘතියේ නිර්මාපකයා මෙතුමා වේ.
(i) ඩී.ආර්. පීරිස් (ii) චානක පීරිස් (iii) විජේරත්න රණතුංග (iv) රංග පෙරේරා

25. ලක්දිව සිසාරා ඇවිදිමින් එක් රැස් කළ හෙළ ගී නාදමාලා සුරැකෙන සේ ප්‍රස්තාරයන්ට නගා අගනා කෘතියක් සම්පාදනය කළ සංගීතවේදියා සහ එම කෘතිය වන්නේ,
(i) ඩබ්.බී. මකුලොලුව - සංගීත සම්භවය (ii) සී.ද.එස්. කුලතිලක-හෙළ මිහිර
(iii) ඩබ්.බී. මකුලොලුව - හෙළ ගී මග (iv) සී.ද.එස්. කුලතිලක-ලංකාවේ සංගීත සම්භවය

26. ඩබ්.බී. මකුලොලුව ශූරීන්ගේ 'දෙපානෝ' නාට්‍යයේ ගී තනු සඳහා ආභාසය කොටගත් ජන ගී නාද මාලාවකි.
(i) කෙළි ගී (ii) විරිඳු (iii) ශාන්තිකර්ම ගී (iv) ප්‍රශස්ති ගී

27. නෙළුම් ගීයේ නාදමාලාව ආභාෂය කොට ගනිමින් ''දෑතට වළලු'' නම් සරල ගීයේ තනු නිර්මාණය කළ සංගීතවේදියාණන් වන්නේ,
(i) ඩබ්ලිව්.ඩී. අමරදේව (ii) ඩබ්ලිව්.බී. මකුලොලුව
(iii) සුනිල් ශාන්ත (iv) සී.ද.එස්. කුලතිලක

28. නාඩගම් නාට්‍ය ශෛලිය අනුගමනය කරමින් මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍රයන් අතින් නිර්මිත භාව නාට්‍ය යුගලයකි,
(i) මනමේ - කාලගෝල (ii) කාලගෝල - සිංහබාහු
(iii) සිංහබාහු - මනමේ (iv) මනමේ - බෙරහඬ

29. "මනමේ" නාටකයේ නාඩගම් ලක්ෂණ ඇතිබවට දැක්විය හැකි සාධකයක් නොවන්නේ,
(i) මද්දලය වාදනය කිරීම. (ii) පොතේ ගුරු ප්‍රමුඛ අත්වැල් ගායනය.
(iii) දෙබස් ගීත ස්වරයෙන් කීම. (iv) ගීතනු සඳහා රාගධාරි සංගීතයේ ආභාසය

30. 'ආලෙ බැන්ද මාගේ රම්‍යවන්....' ගීතය තුළින් කාලගෝලගේ චරිතය පිළිබඳව ප්‍රේක්ෂකයා තුළ ඇතිවන හැඟීමකි,
(i) අනුකම්පා සහගත බව (ii) ද්වේෂ සහගත බව
(iii) කපටි චරිතයක් බව (iv) පිළිකුල් සහගත බව

31. පැරණි නාඩගම් ගීය අනුව නිර්මිත නව නාට්‍ය ගීයකි,
(i) ලපනොමවන් සඳසේ (ii) මෙමඟින් ගිය
(iii) දුල් නිමල් සිසිසේ (iv) ඒ බුදු බව පතමින ලොබිනේ.

32. 'මලේ මලේ ඔය නාමල නෙලා වරෙන්....' යන ගීතය,
(i) ආඝාතාත්මක නෙළුම් ගීයකි. (ii) අනාඝාතාත්මක පාරු ගීයකි.
(iii) ආඝාතාත්මක මෙහෙ ගීයකි. (iv) අනාඝාතාත්මක පැල් ගීයකි.

33. අනාඝාතාත්මක මෙහෙ ගී යක ලක්ෂණයක් නොවන්නේ,
(i) නිශ්චිත මාත්‍රා සංඛ්‍යාවකට අනුව තාල බෙදීම. (ii) නිදහසේ ඇද පැද ගැයෙන ස්වභාවය
(iii) ගීතයේ මැද අග යති පිහිටීම. (iv) සාමූහිකව ගායනා කළ හැකි වීම.

34. 'දුප්පත්කමට ගොන් බැඳගෙන දක්කනවා' යන ගැල් ගීයෙන් ගැමියා ප්‍රකාශ කරන අදහසක් නොවන්නේ,
(i) ගොනා පිළිබඳ අනුකම්පා සහගත බව (ii) දෙවියන් දුකට පිහිටවන බව
(iii) දුප්පත්කම අව්‍යාජව ප්‍රකාශ කිරීම. (iv) ගැල් ගමනෙන් ජීවනෝපාය සාර්ථක බව

35. A - මහබෝධි මූලේ C - එන්ඩ ද මැණිකේ මමත් දියඹට
B - සිරිබුද්ධ ගයා විහාරේ D - ඕළුපිපිලා විල ලෙලදෙනවා
ඉහත ගීත අතරින් ග්‍රැමෆෝන් තැටි යුගයේ හින්දි තනු අනුකාරක ගීයකි,
(i) A (ii) B (iii) C (iv) D

36. සිංහලගීය විප්ලවීය වෙනසකට භාජනය කළ ආනන්ද සමරකෝන් මහතා ගැයූ ගීතය,
(i) A (ii) B (iii) C (iv) D

37. ස්වාධීන තනු නිර්මාණය සහිත ගුවන් විදුලියේ මුල් යුගයේ ගීත දෙකකි,
(i) A B (ii) B C (iii) C D (iv) A D

38. සුනිල් ශාන්තයන් විසින් පද රචනය, සංගීතය හා ගායනය කළ ගුවන් විදුලියේ මුල්ම සරල ගීතය,
(i) A (ii) B (iii) C (iv) D

39. ස්ථායී අන්තරය කොටස් හා මුල් වාදන අකුරු වාදන එකට තනුමතට නිර්මාණය වී ඇති ගීතය වන්නේ,
(i) A (ii) B (iii) C (iv) D

40. 'එන්ඩද මැණිකේ මමත් දියඹටා' ගීයේ ඇති සුවිශේෂත්වයකි,
(i) ස්ථායී අන්තරා කොටස් එකම තනුවට ගැයීම. (ii) ගීතය දිගින් වැඩිවීම.
(iii) වාද්‍ය භාණ්ඩ වැඩියෙන් භාවිත කිරීම. (iv) රාගාශ්‍රිත තනුවක් වීම.



(C·01x40=

**කැලණිය අධ්‍යාපන කලාපය**

**දෙවන වාර පරීක්ෂණය - 2017**

| | | |
|---|---|---|
| 10 ශ්‍රේණිය | පෙරදිග සංගීතය **II කොටස** | කාලය පැය 03 |

නම : ....................................................................................................

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**

01. කෙටි පිළිතුරු සපයන්න.

(i) භෛරවී රාගයේ ආරෝහණ ස්වර ලියන්න.

(ii) යමන් රාගයේ අනුවාදී ස්වර මොනවාද?

(iii) ~~තබ්ලාවෙන් වැයෙන මිශ්‍ර අක්ෂර 2 ක් නම් කරන්න.~~

(iv) ස්වර පුවරු වාදනය පුහුණු වීම සඳහා යොදාගත හැකි සුළඟේ ආධාරයෙන් වැයෙන ස්වර පුවරු භාණ්ඩයක් නම් කරන්න.

(v) 6/8 රිද්මය නිරූපණය කළ හැකි ස්වර පාදයක් නිර්මාණය කර ලියන්න.

(vi) කපිරිඤ්ඤා සංගීතය සඳහා යොදා ගන්නා සංගීත භාණ්ඩ 2 ක් නම් කරන්න.

(vii) නව නාට්‍ය කලාවේ පුරෝගාමියා වශයෙන් සලකන්නේ කවුද?

(viii) ලංකාවේ පැරණි නාඩගමක් නම් කරන්න.

(ix) අනාඝාතාත්මක මෙහෙ ගී පාදයක් ලියන්න.

(x) රිදීවලාව, ගුවන් තොටිල්ල යන කෘති කාගේ නිර්මාණයක් ද?

(xi) මනමේ නාට්‍යයේ ගීතයක මුල් පාදයක් ලියන්න.

(xii) Sign to Sign (සයින් ටු සයින්) සංකේතය ඇඳ දක්වන්න.

(ලකුණු - 12)

02. සරල ගීත ප්‍රස්තාරයක දැකිය හැකි සංකේත හා හඳුන්වන නම් යොදා වගුව සම්පූර්ණ කරන්න.

(i)

| | හඳුන්වන නම හෝ සංකේතය |
|---|---|
| ගීතයක පෙර වාදනය | |
| ගීතයක ස්ථායී කොටස | |
| අතුරුවාදනය | |
| අන්තරා කොටස | |
| ගීතය අයත් ශ්‍රැතිය | |
| ගීතය විචිත්‍ර කෙරෙන කුඩා ස්වර කොටස් | |

(ලකුණු - 06)

(ii) පහත දැක්වෙන ස්වර ප්‍රස්තාරයන්ට ගැලපෙන රිද්මය ඉදිරියෙන් දක්වන්න.

උදා:- | ස ස - | ස ස - | ස - ස | ස - - | - 3/4

1. ස - ස - | ස - ස ස | ස - ස ස | ස - - -

2. ස ස ස ස ස - | ස - - ස ස - | -

3. ස - | ස - ස | ස - | ස ස ස | -

(ලකුණු - 06)

03. පහත දී ඇති ජන ගී පද මෙහෙ ගී, ඇදහිලි ගී, සමාජ ගී වශයෙන් වගුගත කර ඔබ දන්නා තවත් ගීපද දෙක බැගින් ඇතුළත් කරන්න.

A - රන්දෑ කැති ගෙන නිති සැසෙනවා
B - එළුවන් කන්නයි මං ආවේ
C - අතට වෙරළු ඇහිඳ ගෙනේ
D - මලේ මලේ ඔය නාමල නෙලා වරෙන්
E - සීත ගඟුලෙදී ඇඟ පේවෙනවා
F - නිරිත කොන යුතා මල් මල් සුවඳ ඇති

| | |
|---|---|
| මෙහෙ ගී | |
| ඇදහිලි ගී | |
| සමාජයීය ගී | |

(ල.12)

04. (i) භෛරවී සහ යමන් රාගවලට අදාළ ලක්ෂණ රාග අනුව වෙන්කර වගුගත කරන්න.

(i) ස්වර දොළසම යොදාගත හැකි රාගයකි.
(ii) භක්ති රසය වඩාත් දනවන රාගයකි.
(iii) කල්‍යාණ ථාටයෙන් ජනිත වේ.
(iv) ම, ස, වාදි සංවාදී වේ.
(v) තීව්‍ර මධ්‍යමය යෙදේ.
(vi) රාත්‍රී ප්‍රථම ප්‍රහරය ගායනයට සුදුසුය.


(ලකුණු - 06)

(ii) පහත දක්වා ඇති සර්ගම් ගීතයේ හිස්තැන් පුරවා ගීතය සම්පූර්ණ කරන්න.

| | | | |
|---|---|---|---|
| නි ධ - ප<br>..............................<br>.............................. | ..............................<br>ග ම' ප ධ<br>ප ධ නි ස̇ | ප - - -<br>ප ම' ග රි<br>.............................. | ප ම' ග රි<br>..............................<br>ප ම' ග ම' |
| ග ග ප ධ<br>..............................<br>.............................. | ප ස̇ - ස̇<br>ධ ප නි ධ<br>ප ධ නි ස̇ | ..............................<br>ප ම' ග රි<br>රි̇ ස̇ නි ධ | ස̇ නි ධ ප<br>..............................<br>.............................. |

(ලකුණු - 06)

05. පහත දක්වා ඇති තබ්ලාවේ මුහුණත රූපසටහන ඇසුරින් පිළිතුරු සපයන්න.




(i) ඉහත දැක්වෙන අංක අනුව නිපදවෙන අවනද්ධ අක්ෂර ලියන්න.

1. – දයාවේ සයාහි -

2. – දායාවේ ලවය -

3. – දායාවේ චාන්ටිය -

4. + 3 = ගෙ + න -

4. + 2 = ගෙ - තිං -

(ලකුණු - 05)

(ii) මෙම අක්ෂර අනුව ගොඩ නැගෙන හින්දුස්ථානි තාලයක් ප්‍රස්තාර කරන්න. (ලකුණු - 07)

06. (i) ග්‍රැමෆෝන් ගී යුගයේ ආරම්භය පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

(ii) කපිරිඤ්ඤා ගීතයක ලක්ෂණ 4 ක් ලියන්න. (ලකුණු 04)

(iii) කපිරිඤ්ඤා සංගීතය ආභාෂය කොටගත් සරල ගීත දෙකක් නම් කරන්න. (ලකුණු 02)